**ශීර්ෂය 121 - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

------------------------------------------------------------------------------------------------

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.1 වගුවෙහි ඇතුළත් අදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම ද ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

--------------------

ශීර්ෂය 121 - ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

---------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.17 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය

පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් විසින් එම විධිවිධානවලට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත් පරිදි සැලැසුම්කර පිළියෙල කර නොතිබුණි. | 2.1 |
| | | 2. ප්‍රසම්පාදන කටයුතු සැලැසුම් නොකිරිම/ ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම. | 2.4 |
| | | 3. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.15 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | 1. කළමනාකරණ අඩුපාඩු | 2.8 |
| | | 2. විසදා නොතිබුණු විගණන ඡේද | 2.7 |
| | | 3. අනුකූල නොවීම් | 2.16 |
| | | 4. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.17 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | 1. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් | 2.3.2 |
| | | 2. විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය ඉටු නොවීම | 2.3.2 |

| | | | |
|---|---|---|---|
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වෙන ආකාරයක් සලසා තිබීම. | 1. වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම. | 2.5(ආ) |
| | | 2. වාහන උපයෝජනයේ අඩුපාඩු | 2.5(ඇ) |
| | | 3. මූල්‍ය හා මෙහෙයුම් කල් බඳු ක්‍රමය යටතේ වාහන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.5(ඈ) |
| | | 4. කාර්යාල පවත්වා ගැනීමේ අඩුපාඩු | 2.5(ඉ) |
| | | 5. බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම් | 2.5(උ) |
| | | 6. වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම. | 2.5(ඌ) |
| | | 7. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ දුර්වලතා | 2.9 |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරනු ලබන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම. | පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.14 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලැකිය යුතු වෙනස්වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ලබාගත් ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ අඩුපාඩු | 2.11(ඇ) |
| 127(6) | ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු | 2.12 |
| | | 2. රජයේ නිලධාරීන්ට | 2.13 |

| | | | |
|---|---|---|---|
| | එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම. | අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | |
| 127(7) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පැනවීමද, වගබලා ගැනීම පිණිස විධිවිධාන යොදන ලද්දේනම් තමා වෙත පැවැරී ඇති වගකීම්වලින් ගණන්දීමේ නිලධාරියා නිදහස් වූවාක් ලෙස සලකනු ලැබේ. රාජ්‍ය ගිණුම්කාරක සභාව හමුවේ පෙනී සිට, තමා වගකීම් දරන දෙපාර්තමේන්තුවල ගිණුම් පැහැදිලි කිරීමෙන් හා සාධාරණීය කිරීමෙන් ගණන්දීමේ නිලධාරියා සමඟ සහාය වීමද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ රාජකාරී භාරයක් වීම. | පාඩු හා හානි | 2.6 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**-------------------------------------------**

**2.1 කාර්යසාධනය**

**----------------**

**සැලැසුම් කිරීම**

**----------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම 2018 වර්ෂයේදී සංශෝධනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ඉටු කළ යුතු ප්‍රධාන කාර්යභාරයන් 11 ක් ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යයන් 125 ක් ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් පිළියෙල කර තිබුණි. එසේ වුවද වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan) පිළියෙල කර නොතිබුණි .

**2.2 කාර්යභාරයන් ඉටු නොකිරිම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කාර්යභාරයන් ඉටු නොකිරීම**

----------------------------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශය විසින් කාර්යයන් 125 ක් ඉටු කළ යුතුව තිබුණත්, ඉන් කාර්යයන් 6 ක් ඉටු කර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු කාර්යයන් 125 ක් ඉටු කිරීම සඳහා සැලැසුම් කළ ව්‍යාපෘති 17 ක් අතරින් ව්‍යාපෘති 16ක් සඳහා රු. මිලියන 10,280.11 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණත්, එයින් කාර්යයන් 14 ක අපේක්ෂිත නිමවුම් මට්ටම ළඟා නොවීම සියයට 28 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක විය.

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

-------------------------------

අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති 09 ක් සඳහා රු. මිලියන 353.5 ක් ඇස්තමේන්තු කර එයින් රු.මිලියන 83.001 ක් සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය කර තිබුණද ඒවායේ ඉටුකිරීමේ ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.

**2.3 ක්‍රියාත්මක කර තිබුණු දේශීය හා විදේශ ආධාර ව්‍යාපෘති**

-----------------------------------------------------------

**2.3.1 දේශීය ව්‍යාපෘති**

----------------

ගංවතුර සහ නායයාම් හේතුවෙන් හානි වූ දිස්ත්‍රික්ක අතුරින් දිස්ත්‍රික්ක 8ක් සඳහා සහන සැලසීම සඳහා විදේශ ආධාර ව්‍යාපෘතියක් මගින් රු.මිලියන 307.46 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 287.98 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 19.48 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 6.33 ක් ඉතිරි කර තිබුණි.

**2.3.2 විදේශ ආධාර ව්‍යාපෘති**

------------------------

**විදේශාධාර ව්‍යාපෘතියේ කාර්යසාධනය**

----------------------------------------

ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් විදුලි ජනක යන්ත්‍ර 4 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර සැපයුම්කාර ආයතනයක් සමග 2018 ජනවාරි 19 දින ගිවිසුම් ගත වී තිබුණද, එම යන්ත්‍ර ලැබී තිබුණේ 2018 ජූනි 23 දින දීය. එසේ වුවද ව්‍යාපෘති කාලය 2018 මාර්තු 09 දින දක්වා මාස 04 කින් දින දීර්ඝ කර ඇති බැවින් තව දුරටත් දින දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කර තිබියදී ව්‍යාපෘතිය යටතේ අත්පත් කර ගත් ස්ථාවර වත්කම් ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට රු.18,232,557 ක් වූ මෙම විදුලි ජනක යන්ත්‍ර 4 ක පිරිවැය සඳහන්ව තිබුණි.

## 2.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු.මිලියන 744.13 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 519.66 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 224.47 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 30.16 ක ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි.

### 2.4.1 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ඉටු කර ගැනීම සඳහා රු.මිලියන 744.13 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, ඉන් රු.මිලියන 519.66 ක් උපයෝජනය කර තිබුණි. එසේ වුව ද අමාත්‍යාංශය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක්, ප්‍රාරම්භක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 2.4.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිම

නිල මෙහෙවර ජංගම සේවය සඳහා රු. 10,060,000 ක් වැයකර පරිගණක 100 ක් මිලදී ගැනීමට 2016 දෙසැම්බර් මාසයේදී තීරණය කර තිබුණු අතර තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය ලැබීමට ප්‍රථම ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය. මෙම පරිගණක, භාණ්ඩ රැගෙන යාමේ පත්‍රය අනුව 2017 ජනවාරි මාසයේ දී ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය භාණ්ඩ භාරගෙන ඇතත් එම පරිගණක අමාත්‍යාංශය වෙත ලැබී තිබුණේ 2017 පෙබරවාරි මාසයේදී ය.

## 2.5 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වත්කම් ලේඛනගත කිරිම

අමාත්‍යාංශය විසින් 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා හඳුන්වාදී තිබුණු ආකෘතිපත්‍ර අනුව සියලු තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත්ව තිබුණි.

(i) වාහන පිළිබඳ ඉදිරිපත් කර ඇති තොරතුරු පත්‍රිකාවල වාහනවල වටිනාකම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ගෘහ උපකරණ හා කාර්යාල උපකරණ ලේඛනයෙහි පවතින ඒකක සංඛ්‍යාව සහ කේතය සම්පූර්ණ කර නොතිබුණි.

### (ආ) වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

අවස්ථා දෙකකදී අනතුරට ලක් වී තිබුණු අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු.117,116 ක් වැය වී තිබුණු මෝටර් රථ 02 ක් වාහන රථගාල තුළ සහ මාර්ගයේ නවත්වා තැබූ අවස්ථාවලදී අනතුරු සිදුවීම හේතුවෙන් රියදුරු තම වගකීමෙන් බැහැර වී තිබුණි.

**(ඇ) වාහන උපයෝජනය**

-----------------------

අමාත්‍යාංශය සතුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාහන 43 ක් පැවැති අතර, වාහන 33 ක පමණක් ධාවනය කළ කිලෝමීටර් ප්‍රමාණය , ඒ සඳහා ඉන්ධන හා ලිහිසි තෙල්, වාහන සේවා කිරීම, වාහන අළුත්වැඩියා හා වාහන රක්ෂණය කිරීම සඳහා වැය කළ වටිනාකම පිළිබඳව විස්තර ඉදිරිපත් විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය සතු වාහන 03ක පමණක් ඉන්ධන දහනයවීම් පරීක්ෂා කර තිබුණි.

(ii) 2018 මාර්තු 19 දිනැති අංක 01/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව ධාවන තත්ත්වයේ නොපවතින වාහන 2018 ජුනි 30 ට පෙර අපහරණය කරන ලෙස දක්වා ඇතත් අමාත්‍යාංශයට අයත් අපහරණ තත්ත්වයේ පවතින වාහනයක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

**(ඈ) මූල්‍ය හා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ වාහන උපයෝජනය**

-------------------------------------------------------------------

අමාත්‍යාංශය විසින් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන 16 ක්ද, මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහනයක්ද, ලබා ගෙන තිබුණු අතර, මෙහෙයුම් කල්බදු වාරික වශයෙන් රු. 488,750 ක් මාසිකවද, ඉන්ධන හා ලිහිසි තෙල් සඳහා රු. 104,848 ක්ද වැයකර තිබුණි.

**(ඉ) කාර්යාල පවත්වා ගැනීමේ වියදම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය ගොඩනැගිලි 03 ක පවත්වාගෙන යන අතර ප්‍රධාන කාර්යාලය කුලී රහිත ගොඩනැගිල්ලක ද වාර්ෂිකව රු. 29,559,600 කුලියක් මත ලබාගත් ගොඩනැගිල්ලක එක් කාර්යාලයක් ද පවත්වාගෙන යනු ලබයි. අනෙක් කාර්යාලය 2016 වර්ෂයේ දී වසර දෙකක කාලයත් සඳහා බදු ක්‍රමය යටතේ ලබාගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර ඒ සඳහා කුලිය 2018 අගෝස්තු මාසය වන විටත් තක්සේරු කර නොතිබුණු බවත් ඒ පිළිබඳ පසු විපරම් කර නොතිබුණු බව සහ ගිවිසුමෙහි දක්වා ඇති පරිදි විදුලි සහ ජල බිල්පත් නිරවුල් කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ii) වාර්ෂික පිරිසිදු කිරීමේ ගාස්තුව රු. 4,812,060 ක් වන අතර ආරක්ෂක සේවා ගාස්තුව රු. 4,698,300 ක් වේ. ඒ අනුව මුළු ගොඩනැගිලි වෙනුවෙන් වූ වියදම රු.39,069,960 ක් වී තිබුණි. ඒ අනුව ඒක පුද්ගල කාර්යාලය පවත්වා ගෙන යාමේ වියදම රු. 136,132 ක් වී තිබුණි.

**(ඊ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

-------------------------------------

2017 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත භාණ්ඩ ඒකක 122 ක් හා භාණ්ඩ ඒකක 295 ක ඌනතා සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලය කරන ලද නිර්දේශ පරිදි කටයුතු කර නොතිබුණි.

**(උ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

----------------------------------------

අමාත්‍යාංශය සතු මෝටර් වාහන 02 ක් විදුලිබල හා පුනර්ජනනීය අමාත්‍යාංශය විසින් ද, තවත් මෝටර් වාහනයක් ජනාධිපති ලේකම් කාර්යාලය විසින්ද, 2015 වර්ෂයේ සිට භාවිතා කරනු ලබන අතර 2017 දෙසැම්බර් 21 දිනැති අංක MF/CG/02/(Cir) දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි 2018 ජූනි 30 ට පෙර විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඌ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

----------------------------------------------------------

වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සතු වාහන 09 ක් අමාත්‍යාංශය විසින් භාවිතා කරන අතර 2017 දෙසැම්බර් 21 දිනැති අංක MF/CG/02/(Cir) දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිදි 2018 ජූනි 30ට පෙර විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.6 පාඩු හා හානි

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ දී වාහන 05ක් අවස්ථා 09 කදී සහ සමාලෝචිත වර්ෂයේදී වාහන 12ක් අවස්ථා 13 කදී අනතුරුවලට භාජනය වී තිබුණු අතර මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභහානි වටිනාකම් හඳුනාගෙන නොතිබුණු අතර, අලාභය ලේඛන ගත කර මුදල් රෙගුලාසි 104 (3) හා (4) ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104(2) බී ප්‍රකාරව අලාභහානි අප්‍රමාදව අයකර ගැනීමට අපොහොසත් වුවහොත් එම අලාභහානි අයකර නොගැනීම සම්බන්ධව වගකිව යුතු නිලධාරින්ගෙන් එම මුදල් ප්‍රමාණය අධිභාරයන් ලෙස අයකරගත යුතු බව දන්වා ඇත. එසේ වුවද 2016 වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් වාහන අනතුරු 09 කට සහ 12 කට සිදුවූ අලාභහානි නිශ්චිතව හඳුනාගෙන නොමැති අතර ඒ සම්බන්ධයෙන් එකී විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.7 විසඳා නොතිබුණු විගණන ඡේද

--------------------------------

2015 වර්ෂයේ ග්‍රාම නිලධාරීන් දහසක් පමණ බඳවා ගැනීමට කටයුතු ආරම්භ කරනු ලැබුවද 2018 මැයි මාසයේදී ග්‍රාම නිලධාරීන් 1412 ක් පමණක් බඳවා ගෙන තිබුණි. එසේ වුවද 2018 අගෝස්තු වන විට තවදුරටත් පුරප්පාඩු 939 ක් පැවතීමෙන් අමාත්‍යාංශයේ ප්‍රධාන අරමුණක් වන ජනතාවට වඩාත් සමීප වූ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයක් සහිත දිස්ත්‍රික්, ප්‍රාදේශිය හා ග්‍රාමීය පරිපාලන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුවී නොතිබුණි.

## 2.8 කළමනාකරණ දුර්වලතා

--------------------------

ග්‍රාම නිලධාරීන් 34 ක් සඳහා ධාරිතා සංවර්ධන පුහුණු වැඩ සටහනක් 2017 ජනවාරි 09 සිට 13 දක්වා ඉන්දියාවේ පවත්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පුහුණු වැඩසටහන සඳහා ග්‍රාම නිලධාරීන් තෝරා ගැනීමේදී ගාල්ල දිස්ත්‍රික්කයෙන් හැර අනෙකුත් දිස්ත්‍රික්කවලින් එක් නිලධාරියකු සම්මුඛ පරීක්ෂණයකින් තෝරාගනු ලැබුවද, තෝරාගැනීමේ කොන්දේසිවලට අනුකූල නොවන ලෙස ගාල්ල දිස්ත්‍රික්කයෙන් ග්‍රාම නිලධාරීන් 06 දෙනෙකු සුදුසුකම් සනාථ කර ගැනීමකින් තොරව තෝරාගෙන තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 01 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ මෙමෝ පත්‍රය අනුව නිලධාරීන් 35 දෙනෙක් මෙම වැඩසටහන සඳහා සහභාගීවන බව සඳහන් කර තිබුණද, නිලධාරීන් 38 දෙනෙක් සඳහා ගුවන් ටිකට්පත්, ආහාරපාන නවාතැන් යනාදී පහසුකම් සැපයීම හේතුවෙන් රු.574,121 ක මුදලක් අතිරේකව දැරීමට සිදුවී තිබුණි.

## 2.9 මහජනයා වෙත සේවා ඉටු කිරීම

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තොරතුරු දැන ගැනීමේ පනත ප්‍රකාරව මහජනයාට තොරතුරු සැපැයීම සඳහා නිලධාරියෙකු පත් කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා ලද තොරතුරු ඉල්ලීම් 56 න් ඉල්ලීම් 16 කට පමණක් තොරතුරු ලබාදුන් අතර ප්‍රතික්ෂේප කළ ඉල්ලීම් හා කොමිසමට ඉදිරිපත් කල ඉල්ලීම් පිළිවෙලින් 10ක් හා 03ක් වුවද යාවත්කාලීන වෙමින් පවතින ඉල්ලීම් සංඛ්‍යාව 27 වැනි විශාල අගයක් ගෙන තිබුණි.

(ආ) මහජනයා ඉදිරිපත් කරන ලද තොරතුරු ඉල්ලීම එක් එක් අංශ හරහා සිදුවීම නිසා ඒ සම්බන්ධ පසුවිපරම් කටයුතු දුර්වල බව නිරීක්ෂණය විය.

## 2.10 තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

(ආ) ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව අමාත්‍යාංශය විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 2.11 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

--------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 03 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2015 | පුනරාවර්තන | 7,983.6 | 7,354.3 | 629.2 | 7.88 |
| | මූලධන | 16,706.5 | 14,346.1 | 2,360.3 | 14.12 |
| | **එකතුව** | **24,690.1** | **21,700.4** | **2,989.2** | **12.10** |
| 2016 | පුනරාවර්තන | 9,440.8 | 7,602.3 | 1,838.4 | 19.47 |
| | මූලධන | 12,765.9 | 6,015.4 | 6,750.5 | 52.87 |
| | **එකතුව** | **22,206.7** | **13,617.7** | **8,588.9** | **38.67** |
| 2017 | පුනරාවර්තන | 8,916.4 | 7,924.5 | 991.9 | 11.12 |
| | මූලධන | 18,025.6 | 9,282.8 | 8,742.8 | 48.5 |
| | **එකතුව** | **26,942.1** | **17,207.3** | **9,734.7** | **36.1** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විසර්ජන ගිණුම**

**(අ) සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය නොකිරීම**

වැය ශීර්ෂයන් 03 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 1.8 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**(ආ) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 26 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 21,743.9 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම වැය විෂයයන්ට අදාළ මුළු වියදම රු.මිලියන 12,124.4 ක් විය. ඒ අනුව මුළු ඉතිරිවීම් ප්‍රමාණය රු.මිලියන 9,619.5 ක් වූ අතර, එම ඉතිරිවීම් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ත් සියයට 94 ත් අතර පරාසයක පැවතිණි.

**(ඇ)** මුදල් රෙගුලාසි 74 ප්‍රකාරව පරිපූරක ඇස්තමේන්තු මගින් අවස්ථා 07ක දී රු.මිලියන 5,128.2 ක අතිරේක ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කර තිබුණි. එසේ වුවද, එම ප්‍රතිපාදන වලින් රු.මිලියන 2,105.8 ක් එනම් සියයට 26 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක ඉතිරිවීම්වලට ප්‍රධාන හේතුව මහා භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම ලෙස ලේකම් විසින් අදහස් දක්වා තිබුණි.

## 2.12 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත අංක 10.03.07.99 සඳහා එකතුව රු.මිලියන182.44 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 194.86 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 106.80 ක් වී තිබුණි.

**10.03.07.99 දරන ආදායම් සංකේතය - බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් ආදායම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04 ක මුල් ඇස්තමේන්තු වටිනාකම සංශෝධනය කිරීමේදී සියයට 10 ක සිට සියයට 35 ක පරාසයකින් වැඩිකර දක්වා තිබුණි. එසේ වුවද එම කාර්යාලවල සංශෝධිත ඇස්තමේන්තු ඉක්මවා තථ්‍ය ආදායම සියයට 40 ක සිට සියයට 99 ක පරාසයකින් වැඩි වීමක් වී තිබුණි.

(ආ) ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 11ක් විසින් මුල් ඇස්තමේන්තු වටිනාකම් අඩු කර දක්වා තිබුණු අතර, එය සියයට 1.82ක සිට සියයට 70ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 8ක සංශෝධිත ඇස්තමේන්තු ඉක්මවා සියයට 11.36ක සිට සියයට 101.68ක් දක්වා පරාසයකින් තත්‍ය ආදායම වැඩි වී තිබුණි.

(ඇ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව ආදායම් පුරෝකථනය හා ඇස්තමේන්තු කිරීමේ දී වෙනස්වන ආර්ථික තත්ත්වයන්ගේ සහ තථ්‍ය ආදායම් ක්‍රියාකාරීත්වය මත ඇස්තමේන්තු අඛණ්ඩව සංශෝධනය කළ යුතු බව සඳහන් කර තිබුණි. එසේ වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාල 10 ක් විසින් 2017 මැයි 31 දිනට ලැබී තිබූ තථ්‍ය ආදායම් තත්ත්වය නිසි ලෙස සැලකිල්ලට භාජනය නොකර, ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි.

## 2.13 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට විෂය අංක 12101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 650.00 | 643.03 | 230.00 | 235.20 | 1600.00 | 797.38 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ශේෂය නිරවුල් කිරීම**

---------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාල 15 ක අත්තිකාරම් 'බී' ගිණුමට අදාළව භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂ අතර රු. 920,182 වෙනසක් නිරීක්ෂණය විය. වෙනස්කම් නිවැරදිකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අමාත්‍යාංශය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ගෙන නොතිබුණි.

(ආ) **හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

----------------------------------------

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 2,217,324 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 4 ක් වැඩි කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ඇ) **ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අයකර නොගැනීම**

---------------------------------------------------------------------------

2004 ඔක්තොම්බර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාල 14 ක ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන් 50 ක ගෙන් සහ නිලධාරින් සංඛ්‍යාව දන්වා නොතිබුණු දිස්ත්‍රික් ලේකම් කාර්යාල 2ක එකතුව රු.මිලියන 2.79 ක ණය ශේෂ අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් මාසික ගිණුම් සාරාංශ මගින් අයකර ගැනීමට කටයුතු කිරීම හෝ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.14 පොදු තැන්පත් ගිණුම්

------------------------

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 6.45 ක් විය. සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන්පත් අනුව පොදු තැන්පත් ගිණුම් අංක 6000/0000/00/0008/0012/000 හි ශේෂය රු.955.688 ක සමාලෝචිත වර්ෂය ආරම්භයේ හා අවසානයේද නොවෙනස්ව පැවතීම හේතුවෙන් ගිණුම නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබු බව නිරීක්ෂණය විය.

## 2.15 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර , ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | පොදු 267 ප්‍රකාරව ලොග් සටහන් | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) | පාඩු හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (iii) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(I) | පවත්වා නොතිබුණි |
| (iv) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |

**2.16 අනුකූල නොවීම්**

**2.16.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | **රු.** | |
| 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 151 (2) හා 151(3) වගන්ති | - | අපරීක්ෂාකාරීව හෝ අන්තරාදායක ආකාරයෙන් හෝ අන්තරාදායක වේගයෙන් සහ මහාමාර්ගය පාවිච්චි කරන වෙනත් තැනැත්තන් කෙරෙහි යුක්ති සහගත සැලකිල්ලක් නොමැතිව මෝටර් වාහනය ධාවනය කිරීම හේතුවෙන් 2016 වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයට අයත් වාහන අවස්ථා 06 කදී අනතුරට ලක්ව තිබූ අතර, අලාභය ගණනය කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 103 (ආ) | - | 2016 වර්ෂයේ සහ 2017 වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 2ක් සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| **(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | | රජයේ සෑම නිලධාරියෙකුම තම පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතුය. අමාත්‍යාංශයේ රියදුරන් විසින් තම පැමිණීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර තිබුණද පිටවීම සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2014 නොවැම්බර් 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 දරන චක්‍රලේඛයේ XXX ඡේදය | 425,880 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ II/III ශ්‍රේණියේ ගණකාධිකාරී ලෙස රාජකාරී කරන නිලධාරිනියක් 2015 වර්ෂයේ ජූලි සිට 2018 වර්ෂයේ පෙබරවාරි දක්වා කාලපරිච්ඡේදයේදී සහකාර ලේකම්ගේ අනුමැතියෙන් පෞද්ගලික පරිහරණය සඳහා වාහනය පාවිච්චි කිරීම හේතුවෙන් චක්‍රලේඛයේ විධිවිධානයන්ගෙන් බැහැර වී තිබුණු බව නිරීක්ෂණය විය. |

## 2.17 මානව සම්පත් කළමනාකරණය

### 2.17.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 7,488.78 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 24 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 6 | 3 | 3 | - |
| (iii) | ද්විතියික මට්ටම | 193 | 187 | 6 | 26 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 89 | 72 | 18 | - |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 1 | - | - |
| | **එකතුව** | **322** | **287** | **37** | **26** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත තනතුරු සංඛ්‍යාව ඉක්මවා බඳවාගෙන ඇති නිලධාරීන් 26 දෙනෙකු සම්බන්ධ විධිමත් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු පිළිබඳ තොරතුරු නිවැරදිව ඉදිරිපත් කර නොමැති අතර, අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ එකිනෙකට පරස්පර තොරතුරු ඉදිරිපත් කර තිබීම හේතුවෙන් කාර්ය මණ්ඩලය සම්බන්ධව නිවැරදි තොරතුරු ඉදිරිපත් නොවුණි.

(ඇ) 2017 අයවැය ඇස්තමේන්තුවට අනුව අනුමත මුළු කාර්ය මණ්ඩලය දක්වා නොතිබූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 18,425 ක් ලෙස දක්වා තිබුණි. අමාත්‍යාංශය ඉදිරිපත් කර තිබූ කාර්ය මණ්ඩල තොරතුරුවල තථ්‍ය කාර්ය මණ්ඩලය 287 ක් ලෙස දක්වා තිබීමෙන් 2015 වර්ෂයේදී ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් මෙම අමාත්‍යාංශයට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් හා ක්‍රමසම්පාදන සේවයේ නිලධාරී කාර්යමණ්ඩලය අනුමත කරවා නොගැනීම මෙයට හේතු වී තිබුණි.

**(ඇ) කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කාර්ය මණ්ඩලය නිතිපතා පුහුණු කිරීමේ අවශ්‍යතාවක් ඇති නමුත් විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව සියළු නිලධාරීන් පුහුණුව ලද බවට තොරතුරු ඉදිරිපත් නොවුණු අතර අමාත්‍යාංශය විසින් එහි කාර්ය මණ්ඩලය පුහුණු කිරීම පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු පවත්වාගෙන නොතිබුණු බැවින් නිශ්චිතවම පුහුණුව ලද සංඛ්‍යාව අනාවරණය නොවුණි.

(ii) විගණනය සඳහා ඉදිරිපත් වූ තොරතුරු අනුව කිසිම ආකාරයේ පුහුණුවක් ලබා නොතිබුණු නිලධාරීන් ගණන 151ක් විය. තවද පුහුණුවීම් ලබන නිලධාරීන් නැවත නැවතත් දේශිය හා විදේශීය පුහුණුවීම් සඳහා යොමුකර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 2 තුළ පුහුණු කිරීම් කටයුතු සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයන්ට අනුව උපයෝජනය සියයට 43.04 ක සිට සියයට 69.64 ක් දක්වා පරාසයක් වී තිබුණි.